# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail:*psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர<br>Secretary | 081-2213096 | සහකාරලේකම්<br>உதவிசெயலாளர<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


මගේඅංකය
எனது இல.
My No. CPC/PSC/6/11/2/503

ඔබේඅංකය
உமது இ

දිනය
திகதி
Date 2023.10. 25

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන්වෙත,

**<u>සියලුම තනතුරු වල සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ශ්‍රේණි උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සම්බන්ධවයි</u>**

මෙම කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන සියලුම තනතුරුවලට අදාළ සේවා ව්‍යවස්ථා හා උසස් කිරීමේ පරිපාටින්හි විධිවිධාන අනුව සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ශ්‍රේණි උසස්වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරින්ගේ අයදුම්පත් කිසිදු හේතුවකින් තොරව බොහෝ ප්‍රමාද වී මෙම කොමිෂන් සභාව වෙත ලැබෙන බව නිරීක්ෂණය කළ ගරු කොමිෂන් සභාව විසින්, අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සම්බන්ධව කඩිනමින් කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.

02. ඒ අනුව අදාළ නිලධාරින් සුදුසුකම් සම්පූර්ණ කළ වහාම නියමිත උසස්වීම සඳහා අදාළ ආයතන ප්‍රධානින්ගේ නිර්දේශ සමඟ සියලු ලේඛණ නිවැරදිව මෙම කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, තම යටත් නිලධාරින්ගේ උසස්වීම් ඇතුළු පත්වීමට අදාළ ඉදිරි කටයුතු නිසි වෙලාවට ඉටු කිරීම ආයතන ප්‍රධානින්ගේ වගකීමක් වන අතරම තම උසස්වීම, අදාළ නිලධාරීන් මඟින් ඉටු කරවා ගැනීම පත්වීම් දරන්නාගේ ද වගකීමක් වන බව ගරු කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. ඒ අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරින් මෙ පිළිබඳ දැනුවත් කරමින් ඔවුන් සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි ප්‍රමාදයකින් තොරව උසස් කිරීමේ අයදුම්පත් මෙම කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.

04. තවද දෙපාර්තමේන්තු මට්ටමින් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වන තනතුරු වල සේවයේ නියුතු නිලධාරින් සඳහා අදාළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ද නියමිත කාල සීමාව තුළ පැවැත්වීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.